මාධ්‍ය තුළ ඇතැම් විටකදී භාවිතා වන නිෂේධනාත්මක නාමකරණයන් ඔස්සේ, ශිෂ්ට සම්පන්න චින්තනයක් දියුණු කිරීම සඳහා බාධාවන් ඇතිවීමත්, යම් යම් සමාජ කොටස් පුනරුත්ථාපනයකින් හෝ යහමගට ගැනීමට ඇති ඉඩ ඇවිරීමටත් හැකියාවක් ඇති බව අපි මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු.

"කන්දකාඩුවේ කුඩ්ඩෝ කොරෝනා දෙවැනි රැල්ලකට පාර කැපුවාද" යන මැයෙන් යුතුව පළ වන අරුණ පුවත ගැටළුකාරී වන්නේද ඒ අයුරිනි. මෙහි නිෂේධනාත්මක නාමකරණයන් සඳහන් වනවාක් මෙන්ම, කොවිඩ්-19 ව්‍යාප්තිය සම්බන්ධයෙන් යම් කොටසකට දෝෂාරෝපණය කිරීමක්ද සිදුවේ.

කොවිඩ්-19 පුවත් වාර්තා කිරීම සම්බන්ධයෙන් තිබෙනා මාර්ගෝපදේශනයන් මගින් පෙන්වා දෙන්නේ, කොවිඩ්-19 ආසාදනය වූවන් රෝගීන් ලෙසින් මිස රෝගය පතුරුවන්නන් ලෙසින් හැඳින්වීම නොකළ යුතු බවයි. මෙම පුවත සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළද කතිකාවන් ඇතිවී තිබුණි,. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #SathiAgaAruna